# <u>සංවරණ සීමා ලිහිල් කිරීම</u>

1. දැනට පවතින සංවරණ සීමාවන් 2021 ජූලි 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි තවදුරටත් ලිහිල් කරනු ඇත.

2. කෙසේ වෙතත් දැනට පවතින අන්තර් පළාත් සංවරණ සීමා කිරීම් තව දුරටත් ඉදිරි දින 14 ක් සඳහා නොවෙනස්ව පවතිනු ඇත.

3. වසංගත රෝග තත්වයන්හි වෙනස්වීම් මත පදනම්ව ලිහිල් කරන ලද සංවරණ සීමා සංශෝධනයට ලක් විය හැකිය.

4. අවසර ලබා දී ඇති කාර්යයන් සඳහා නිකුත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට තදින් අනුකූල වන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලබයි.

5. සියළුම රාජ්‍යය හා පෞද්ගලික ආයතන වල ක්‍රියාකාරීත්වය නව සාමාන්‍යභාවයට අනුකූල වන ලෙස පවත්වාගෙන යාමට වග බලාගත යුතුය.

6. සියළුම ආයතන, අංශ හා මහජනතාව **DReAM** (D - පුද්ගල දුරස්ථභාවය, සමූහ ලෙස රැස් නොවී සිටීම, නිවසටම වී සිටීම, Re - ශ්වසන චර්යා විධි පවත්වාගෙන යාම, A- විෂබීජහරණ පිළිවෙත්: නිවැරදිව දැත් සේදීම, විෂබීජහරණය කිරීම, M- නිවැරදිව මුහුණු ආවරණ පැළදීම) ලෙස හඳුන්වා දී ඇති පූර්වාරක්ෂක ක්‍රමවේද සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ තරයේ පිළිපදිමින් කටයුතු කල යුතුය.

| අනු අංකය | ක්‍රියාකාරකම් | සීමා ලිහිල් කිරීම් - සියළුම පළාත් සඳහා | බස්නාහිර පළාත සඳහා පමණක් ඇතිකරනු ලබන විශේෂ තත්ව |
|---|---|---|---|
| 1 | පූජනීය ස්ථාන( පන්සල්, පල්ලි, කෝවිල් වැනි) | විවෘතයි. | |
| 2 | කර්මාන්ත ශාලා (ඇඟලුම් හා අනෙකුත් කර්මාන්ත ) | ක්‍රියාත්මකයි. | |
| 3 | රජයේ ආයතන සහ පෞද්ගලික ආයතන | විවෘතයි.<br>අවම සේවක සංඛ්‍යාවකින් කටයුතු කල යුතු වේ.<br>අවශ්‍යතාවය මත ආයතන ප්‍රධානියාට සේවයට ගෙන්වාගත හැකි සේවකයින් ප්‍රමාණය තීරණය කල හැක. එසේ කිරීමේ වගකීම ආයතන ප්‍රධානියා සතුය. | |
| 4 | මංගල උත්සව | අවසර ඇත.<br>ශාලාවේ ආසන ධාරිතාවයෙන් 25% ක් වන පරිදි හෝ උපරිම 150 සංඛ්‍යාවකට යටත්ව පැවැත්විය හැකිය. | |
| 5 | ආයතනමය රැස්වීම් | අවසර ඇත.<br>සහභාගීවන්නන් උපරිම ශාලා ධාරිතාවෙන් 25%ක් නොයික්ම වන ලෙස පැවැත්විය යුතුවේ. | |
| 6 | උපයෝගිතා සේවා සහ වෙනත් අත්‍යවශ්‍ය සේවා | ක්‍රියාත්මකයි.<br>අවම කාර්ය්‍ය මණ්ඩලයක් සමඟ ක්‍රියාත්මක කළ හැකිය. | |
| 7 | පුද්ගලික / කුලී රථ සහ ටැක්සි රථ | අවසර ඇත.<br>ආසන ධාරිතාවයට පමණක් සීමා වේ. | |
| 8 | කෘෂිකර්මාන්තය හා වැවිලි කර්මාන්තය | විවෘතයි.<br>"කන්න" රැස්වීම් සඳහා සහභාගිවන්නන් උපරිම 25 දෙනෙකුට සීමා විය යුතුය. | |
| 9 | එළිමහන් වෙළදාම / සති පොළ | විවෘතයි.<br>පළාත් පාලන ආයතනය විසින් බලාත්මක කරන ලද කොවිඩ් 19 රෝග පැතිරීම වැළැක්වීමේ සීමාවන් යටතේ ක්‍රියාත්මක කල යුතුය. | |
| 10 | වැඩමුළු / සම්මන්ත්‍රණ / සන්නාම දියත් කිරීම | අවසර ඇත.<br>උපරිම සහභාගීත්වය 50 දෙනෙකුට සීමා වන පරිදි පැවැත්විය හැක. | |

Dr. ASELA GUNAWARDENA
Director General of Health Services
Ministry of Health
"Suwasiripaya"
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha,
Colombo 10.

| අනු අංකය | ක්‍රියාකාරකම් | සීමා ලිහිල් කිරීම් සියළුම පළාත් සඳහා | බස්නාහිර පළාත සඳහා පමණක් ඇතිකරනු ලබන විශේෂ තත්ව |
|---|---|---|---|
| 11 | පොදු ප්‍රවාහන සේවය | ආසන ධාරිතාවෙන් 50% කට සීමා වේ. | ආසන ධාරිතාවෙන් 30% කට සීමා වේ. |
| 12 | සියලු විභාග පැවැත්වීම | අවසර ඇත. | |
| 13 | මූල්‍ය ආයතන (බැංකු, මූල්‍ය සමාගම්, ඒකස් මධ්‍යස්ථාන ආදිය) | විවෘතයි.<br>ඕනෑම වේලාවක මුළු ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව 10 නොඉක්මවිය යුතුය. අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය යොදවා ක්‍රියාත්මක කල යුතුය. | |
| 14 | ආර්ථික මධ්‍යස්ථාන | විවෘතයි.<br>තොග වෙළදාම සඳහා | |
| 15 | ජංගම වෙළඳුන් | අවසර ඇත. | |
| 16 | පදික වෙළෙන්දන් | අවසර ඇත.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ ක්‍රියා කල යුතුය. | |
| 17 | සිල්ලර වෙළඳසැල් / කඩ | විවෘතයි.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව | |
| 18 | බේකරි / බේකරි සේවා | විවෘතයි. | |
| 19 | සුපිරි වෙළඳසැල් | විවෘතයි.<br>එක් වරකට ස්ථානයේ සිටිය හැකි ඉඩ පරිභෝගිකයන් සංඛ්‍යාව එම ස්ථානයේ ධාරිතාවයෙන් 25% ක් නොයික්මවන ලෙස | |
| 20 | සාප්පු සංකීර්ණ | විවෘතයි.<br>සාප්පු සංකීර්ණ තුල නිදැල්ලේ ගැවසීම, ඒකරාශී වීම හා විනෝදාස්වාද කටයුතු සඳහා අවසර නැත.<br>තනි සාප්පු සඳහා ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව කටයුතු කල යුතුය. | |
| 21 | මෝටර් රථ ගරාජ්/ටයර් සේවා/වාහන සේවා ස්ථාන | විවෘතයි. | |
| 22 | මැහුම්කරුවන් සහ ඇඳුම් සාදන්නන්, සන්නිවේදන, ඡායා පිටපත් සාප්පු, ඇඳුම්, රෙදිපිළි සාප්පු සහ වෙනත් සිල්ලර සේවා ආශ්‍රිත ආයතන | විවෘතයි. | |
| 23 | ලී බඩු/ඉදිකිරීම් ද්‍රව්‍යවෙළඳ සැල්/රෙදි සේදීමේ පහසුකම් ආයතන | විවෘතයි. | |
| 24 | බාබර් සහ රූපලාවණ්‍යාගාර | විවෘතයි.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ වේලාවන් වෙන් කර ලබාදී පමණක් පවත්වාගෙන යා හැකිය. | |
| 25 | නිමි ඇඳුම් විකිනීමේ වෙළඳසැල් | විවෘතයි.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව | |
| 26 | ගොඩනැගිලි ඉදිකිරීමේ ස්ථාන | අවසර ඇත. | |
| 27 | වැඩිහිටි හා ළමා නිවාස | අමුත්තන් පැමිණීම තහනම්. | |



Dr. ASELA GUNAWARDENA
Director General of Health Services
Ministry of Health
"Suwasiripaya"

| අනු අංකය | ක්‍රියාකාරකම් | සීමා ලිහිල් කිරීම් සියළුම පළාත් සඳහා | බස්නාහිර පළාත සඳහා පමණක් ඇතිකරනු ලබන විශේෂ තත්ව |
|---|---|---|---|
| 28 | අධිකරණ | නිශ්චිත වේලාවක් තුල වරකට උසාවි පරිශ්‍රයේ සහ ඕනෑම අධිකරණ කාමරයක සිටිය හැකි පුද්ගල ධාරිතාවෙන් 50% ක (කාර්ය මණ්ඩලය ඇතුළුව) උපරිම ධාරිතාවයෙන් පමණක් ක්‍රියාත්මක විය හැක. | නිශ්චිත වේලාවක් තුල වරකට උසාවි පරිශ්‍රයේ සහ ඕනෑම අධිකරණ කාමරයක සිටිය හැකි පුද්ගල ධාරිතාවෙන් 35% ක (කාර්ය මණ්ඩලය ඇතුළුව) උපරිම ධාරිතාවයෙන් පමණක් ක්‍රියාත්මක විය හැක. |
| | | අ. විනිසුරුවරයාගේ විශේෂ අවසරයකින් තොරව මහජනතාව හෝ සිරකරුවන් අධිකරණය තුලට හෝ අධිකරණ පරිශ්‍රයට ඇතුලත් කර ගැනීම සිදුකල නොහැක.<br><br>ආ. අධිකරණයන්හි නඩු විභාග කිරීම විනිසුරුවරයාගේ අභිමතය පරිදි විහිදවූ පදනමක් මත සිදුකල යුතුය. | |
| 29 | බන්ධනාගාර | අමුත්තන් පැමිණීම තහනම්. | |
| 30 | පුස්තකාල | විවෘතයි.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව විවෘත කල හැක. | |
| 31 | ක්‍රීඩා ක්‍රියාකාරකම් (ක්‍රීඩා හා ක්‍රීඩා ඉසව් පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යංශය විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශය අනුව කටයුතු කරන්න) | අවසර ඇත.<br>තනිව පුහුණුවීම සඳහා පමණි.<br>සාමූහික ක්‍රියාකාරකම් සඳහා අවසර නැත . | |
| 32 | ව්‍යායාම මධ්‍යස්ථාන / ගෘහස්ථ ක්‍රීඩාගාර | විවෘතයි.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව. | |
| 33 | ඇවිදීමේ මංතීරු | විවෘතයි.<br>තනි තනිව ඇවිදීම සඳහා පමණි, එක්රැස්වීමට අවසර නැත. | |
| 34 | අවමංගල්‍ය කටයුතු (කොවිඩ්-19 අසාදනය නොවූ මෘතදේහ සඳහා) | අවසර ඇත.<br>දේහය මුදා හැර පැය 24 ක් ඇතුලත අවසාන කටයුතු කල යුතු ය. පුද්ගලයින් 50 දෙනෙකුට සහභාගී විය හැක. | |
| 35 | සිනමාහල් හා කෞතුකාගාර | විවෘතයි.<br>සිමාහල් හා රංගශාලා ආසන ධාරිතාවෙන් 50% සහ කෞතුකාගාර ශාලා ධාරිථාවෙන් 50% ක් නොඉක්මවන අමුත්තන් සීමාවට යටත්ව. | |
| 36 | අවන්හල් (ස්ථානය තුල අනුභව කරන) Restaurant (dining in) | විවෘතයි.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව. | |
| 37 | අවන්හල් (පිටතට ආහාර රැගෙන යන) Restaurant (take away/delivery) | අවසර ඇත.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව. | |
| 38 | ස්පා (spa) | විවෘතයි.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව. | |
| 39 | හෝටල් සහ විවේකාගාර (Hotels and rest houses) | විවෘතයි<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව | |
| 40 | දිවාසුරැකුම් මධ්‍යස්ථාන | ක්‍රියාත්මකයි.<br>50% ධාරිතාවයෙන් විකල්ප දිනයන් ලබා දී පවත්වාගෙන යා හැකිය. | |



Dr. ASELA GUNAWARDENA
Director General of Health Services
Ministry of Health

| අනු අංකය | ක්‍රියාකාරකම් | සීමා ලිහිල් කිරීම් සියළුම පළාත් සඳහා | බස්නාහිර පළාත සඳහා පමණක් ඇතිකරනු ලබන විශේෂ තත්ව |
|---|---|---|---|
| 41 | පිහිනුම් තටාක | විවෘතයි. | |
| 42 | කැසිනෝ, රාත්‍රී සමාජශාලා | වසා ඇත. | |
| 43 | ඔට්ටු මධ්‍යස්ථාන | වසා ඇත. | |

7. ඉහත දැක්වූ පරිදි සංවරණ සීමා ලිහිල් කිරීම් සිදු කලද යම් ප්‍රදේශයන් එම කාල සීමාව තුල හුදකලාභාවයට පත්කර තිබෙන්නේ නම් සංවරණ සීමා ලිහිල් කිරීම් එම ප්‍රදේශ වෙත වලංගු වන්නේ නැත.

Dr. ASELA GUNAWARDENA
Director General of Health Services
Ministry of Health
"Suwasiripaya"
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha,
Colombo 10.